VIDUS 2-1-12

# ආහාර කෙලසීම – ජාතික උවදුරකි

ශ්‍රී ලංකාවේ ආහාර වර්ග කෙලසීම බැරෑරුම් ප්‍රශ්නයක් බවට පත්ව ඇති අයුරු පෝෂණ සෞඛ්‍යය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥ උපදේශක තැන්පත් පී. ජේ. අයියර් මහතා විසින් නොබෝද පැවැති සාකච්ඡාවක දී හෙළි කරන්නට යෙදින. ශ්‍රී ලංකාවේ ආහාර සහ ඖෂධ ආඥපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 1977 පෙබරවාරි මස 15 දින මහනුවර මහා ලේකම් කාර්‍යාලයේ දී මෙම සම්මන්ත්‍රණය පවත්වනු ලැබිණ. දැනට බලපැවැත්වෙන පෝෂණ අණපණත් සංශෝධනයෙහි ලා රජයට සහායවීම, පෝෂණ විශ්ලේෂණ රසායනාගාර වැඩි දියුණු කිරීම, පෝෂණ ද්‍රව්‍ය විශ්ලේෂණ ආදියේ නිරත ආහාර පරීක්ෂකවරුන් සහ රසායනාගාර නිලධාරින් වෙනුවෙන් පුහුණු කිරීමේ වැඩ සටහන් සහ අධ්‍යාපන කවයන් පැවැත්වීම අයියර් මහතාගේ ශ්‍රී ලංකා මෙහෙයට අයත් කාර්යයන් වේ.

1974, 1975, 1976 යන වර්ෂ වල කොළඹ නගරයේ අලෙවි වුණු බෝතල සහ දවටන වල ඇසුරු ආහාර ද්‍රව්‍ය 1600 ක් පරීක්ෂාවට සහ විශ්ලේෂණයට භාජනය කරන ලද බැව් අයියර් මහතා පැවසීය. කිරි, විනාකිරි, ජෑම් මිරිස් කුඩු, තලතෙල්, කෝපි කුඩු ආදි වෙළඳ පල අලෙවිය සඳහා වූ ද්‍රව්‍යයන් ගෙන් 60% ක් පමණ බොහෝ විට, විෂ සහිත හෝ සෞඛ්‍යයට හානිකර ආදේශකයන් සමඟ සංයෝග කරන ලද ඒවා වූ අතර එම ආහර ද්‍රව්‍ය මනුෂ්‍ය පාරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයේ පැවතින. කිරි බොහෝ අවස්ථාවන්හි දී වතුර හෝ කිසියම් පිටිවර්ග සමඟ කලවම් කොට ඇත. කෝපි කුඩු වලින් වැඩි ප්‍රතිශතයක බැද කුඩු කරගත් රටකජු ලෙලි පිටි අඩංගු වේ. විනාකිරිවලට පෝමික් අම්ල මුසු කොට තිබූ අතර එය විෂ සහිත ය. පළතුරු සහ සීනිවලින් සෑදි ඇතැයි සැලකෙන ජෑම්වල ඒ දෙවර්ගය ම අඩංගු නොවිණ. මෙම ව්‍යාජ නිපැයුම් සඳහා යොදා ගෙන තිබූ අමුද්‍රව්‍ය වූයේ අගර් (චීන තෘණ) ජෙලි ය. මද්‍යසාර සහිත ගල් අඟුරුතාර ආශ්‍රිත සායම් ද කෘත්‍රිම රස ගැන්වීම් සහ සැකරින් නම් කෘත්‍රිම පැණිරස කැවීම් මඟින් ද එය රසවත් කොට තිබිණ. තුණපහ කුඩු වල සහ කහ කුඩු වල පිළිවෙලින් ලී කුඩු සහ තිරිඟු පිටි අඩංගුවූ අතර පාට ගැන්වීම සඳහා විෂ සහිත රෙදි සායම් වර්ග යොදා ගෙන තිබිණ.

පෝෂණ වර්ග කෙලසීම වැළැක්වීමේ පියවර විමසීමේ අරමුණින් යුතුව ලංකා ජාතික විද්‍යා සභාවේ නියෝජිතයෙකු සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවක දී සෑම වර්ග වලම කෙලසීම් විෂ අන්තර්ගත නොවන බව පැවසීමට අයියර් මහතා නොපැකිළිණ. වර්ණවත් කිරීම, රස හෝ හැඩ ගැන්වීම හෝ තත්ත්වය රඳවා ගැනීමේ අටියෙන් සකස් කරන ලද ආහාර වර්ග සඳහා භාවිතා කෙරෙන කෘත්‍රිම සායම්, රසකාරක, ද්‍රවකාරක, ඝනකාරක, ස්වේතකරණ ද්‍රව්‍ය ප්‍රතිඅම්ලකරණයන් ආදී විවිධාකාර ආහාර සංයෝජනයන් තවත් බරපතල ප්‍රශ්නයකට තුඩු දී ඇත. මෙවැනි බාහිර අපකාරකයන් බහුල වශයෙන් භාවිතා කිරීම කෙරෙහි ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි ද බලවත් අවධානය යොමුවී ඇති අතර මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් විභාග කර බලා එවැනි ද්‍රව්‍ය භාවිතය මඟින් සිදුවිය හැකි අන්තරායකාරි ප්‍රතිඵල සහ ආරක්ෂිත වැඩ පිළිවෙලවල් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම සඳහා එම සංවිධාන විසින් ඒකාබද්ධ විශේෂඥ කමිටු පත් කොට ඇත. මෙවැනි විවිධ ආහාර සංයෝජනයන් අතර ගල් අඟුරු, තාර, වර්ණකාරක පරිභෝජනය ආශ්‍රිතව බිහි වෙන සෞඛ්‍ය හානි සම්බන්ධයෙන් පියවර ගැනීම අත්‍යාවශ්‍ය බැව් බොහෝ සෙයින් පිළි ගෙන ඇත. මෙම ගල් අඟුරු තාර වර්ණකාරක වලින් බොහෝ වක් කාලයක් තිස්සේ ආහාරයට ගැනීම රෝග වලට හෝ සිහිවිකල් වීමේ රෝග ලක්ෂණ මතු කර වීමට ඉවහල් වන බැව් හෙළි වී ඇත. ශ්‍රී ලංකාවේ බහුලව පාවිච්චි කරනු ලබන වර්ණ කාරකයන් දෙකක් වන මෙටනිල් යෙලෝ සහ රෝඩාමයින් බී යන ද්‍රව්‍ය මෙම අනතුරු දායක ගණයට අයත්වෙති. ශ්‍රී ලංකාවේ මෙවැනි අනතුරුදායක ගල් අඟුරු තාර සායම් වර්ග පෝෂණ ද්‍රව්‍යයන්හි භාවිතය පාලනය කිරීමේ ලා ක්‍රමවත් අණපනත් බිහි කිරීම අත්‍යාවශ්‍ය බව පැවසූ අයියර් මහතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව කඩිනම් පියවර ගනිමින් සිටින බැව් සඳහන් කරන ලදී.

පරිබෝජකයින්ගේ පැත්තෙන් බලන කල, ඔවුන්ගේ නොදැනුවත්කම, උදාසීනත්වය සහ මුලා කළ හැකි බවත් වංචනික නිෂ්පාදකයින් ගේ සහ වෙළඳුන් ගේ අධික ලාභාපේක්ෂාවත් පෝෂණ ද්‍රව්‍ය කෙලසීම පැතිර පැවැත්මට බෙහෙවින් හේතු වී ඇත. මෙම තත්ත්වයට පිළියම් වශයෙන් ඉදිරිපත් කෙරුන යෝජනා පහත සඳහන් පරිදි විය.

(1) කෙලසුණු පෝෂණ ද්‍රව්‍ය පරිභෝජනය තුළින් සෞඛ්‍යයට එල්ල වන තර්ජනය පිළිබඳව පාරිබෝජකයින්, වෙළඳුන් සහ නිෂ්පාදකයින් වෙත අවබෝධයක් ලබාදීම. සාමාන්‍ය ජන මාධ්‍යයන් ගෙන් පුවත් පත් මඟින් සහ ගුවන් විදුලිය මේ සඳහා උපයෝගී කරගත හැකි වනු ඇත.

(2) දැනට බලපැවැත්වෙන නීතිමය විධානයන් (පනත සහ විධිවිධාන) වර්තමාන අවශ්‍යතා සපුරාලන අයුරින් සංශෝධනය කිරීම.

(3) මහජනතාවගේ අභිවෘද්ධිය සහ සුබසාධනය තකා රජය සහ පළාත් පාලන ආයතන විසින් නීතිය මැනවින් ක්‍රියාත්මක කරවීම.

දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා 1949 ආහාර හා ඖෂධ පනත අනුව බලධාරීන් සතර දෙනෙකි. එනම් පළාත් පාලන ආයතන, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සුරාබදු කොමසාරිස් සහ ප්‍රධාන රේගු අයකැමි යනුවෙනි. කෙසේ වුවත් මෙම නීතිය ප්‍රතිඵල රහිත බවට පත්ව ඇත්තේ කෙලෙසූ ද්‍රව්‍ය තොග රසායනාත්මක කිරීම හෝ නිෂ්පාදකයින්ට දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති හෙයින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද සහාය ඇතිව පෝෂණ ද්‍රව්‍ය නීතිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය ලහි ලහියේ ක්‍රියා කරගෙන යයි. නිතිපතා පරීක්ෂන පැවැත්වීමෙන්, ආදර්ශයන් ලබා ගැනීමෙන්, සැකයට භාජනය වන තොග භාරයට ගැනීමෙන්, නීති උල්ලංඝනය කරන්නවුන් නීතිය හමුවට ගෙන ඒම මඟින් පළාත් පාලන ආයතනයන් විසින් ප්‍රතිඵල දායක කාර්ය භාරයක් ඉටු කළ යුතුව ඇත. ජාතියේ සෞඛ්‍යයට අකුල් හෙලන මෙම මහා උපද්‍රවය වලකා ලීමට හැකි අයුරින් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පොදු කාර්ය පසුබිමක් ඇති කළ යුතුවේ. ''පෝෂණ ද්‍රව්‍ය කෙලසීම ජාතික ප්‍රශ්නයක් බවට පත්ව ඇතැයිද, මෙම උවදුර දුරලීම සඳහා දැඩි උනන්දුවකුත්, වැඩි ධෛර්‍යයකුත් මහජනතාව කෙරෙන් පලවිය යුතුව ඇතැයි ද'' අයියර් මහතා අවසාන වශයෙන් පැවසීය.